# පංති සටනේ අලුත් ක්‍රියාමාර්යක්.

ජනතා විමුක්ති පෙරමුණේ ලාල් කාන්ත විමල් වීරවංශ අතර ගැටුම නිකම්ම පුද්ගලික ගැටුමක් නෙවෙයි. ඒක දේශපාලන මත දෙකක් අතර ගැටුමක් හැටියට සැලකිල්ලට ගන්න වෙනව.

ලාල් කාන්ත වෘත්තීය අංශයේ නායකයා හැටියට වැඩ කරන ජනතාවගේ එදිනෙදා ඉල්ලීම් තෙරපීම්වලට අහුවෙන එක පුදුමයක් නෙවෙයි.

අනෙක් අතට විමල් නිරන්තරයෙන් ඉන්නේ දේශප්‍රේමී බලවේග සමහයි. ඒ අනුව සිංහල මැද පංතික ජාතිවාදී මතයට ඔහුට මුහුණ දෙන්නට වෙනවා.

සුළු ධනේශ්වර පක්ෂයක් හැටියට සිංහල සුළු ධනේශ්වරයට වැඩියෙන් කිට්ටු වුණත් එම පංතියේ තරුණයන් වන සරසවි සිසුන්ගේ මතවාදයන්ට තමා ඔවුන් කවදත් මෙහෙවර කළේ. ඒ තරුණයන්ගේ ජාතිවාදය ගුණදාස අමරසේකරලගේ මතයට වඩා වෙනස්.

ඔවුන් බලාපොරොත්තු වෙන්නේ තරුණයන්ගේ සටන් මගින් ගොඩනගන රැඩිකල් පීඩිතයනගේ රාජ්‍යයක්. ඒ අනුව තමා තමනුත් නිර්ධන පංතියට අයත් කියල ඔවුන් තර්ක කරන්නේ.

ඒ නිසා විමල් දැන් කිට්ටු වෙලා ඉන්න දේශප්‍රේමී මැද පංතික පැලැන්තිකාරයින්ට ලොකු විවේචන ජනතා විමුක්ති පෙරමුණ ඇතුලේ වැඩි වෙලා තියෙන්නේ.

දැන් වාම වෙට්ටුවක් අරගෙන තරුණ සිසුන් හා කම්කරුවන් පෙරලිකාරී ලෙස එකතු කරගෙන බලය ගොඩනැගීමේ අදහසට යොමුවෙලා තියෙනව කියල මට නම් පෙනෙනව.

ඉහළ පිරිස් අතර තව දුරටත් යුද්ධය වෙනුවෙන් කථා කරමින් ලෙන්ගතු වීමෙන් අපට වැඩක් වෙන්නේ නැහැ කියන මතයට අනුර, බිමල්, හේරත් වගේ අයත් එකතු වෙලා ඇති.

කොහොමටත් ජනතා විමුක්ති පෙරමුණ තුළ පීඩිත කොටස්වල බලපෑම වැඩියි. එනිසා මහින්ද දැන් තමන්ගේ ආධාරයෙන් බලයට ඇවිත් චියාංකායි ෂෙක් වගේ ගෝලීය බලවතුන්ට මෙන්ම ඉංදීය බලවතුන්ට ආවඩන තැනට පත්වීම ගැන ලෙකු වෛරයක් පහළට ගලාගෙන එන බවයි විමසිල්ලෙන් බැලුවොත් පෙනෙන්නේ.

මේ විදියට ඉහළ රාජ්‍ය බලයට ඇදුන පිරිසත් පහළ පිඩිතයන්ට ළං වූ පිරිසත් අතර ගැටුමේදී ලාල් කාන්තට නිකම්ම ලොකු තැනක් ලැබිල තියෙනව.

මේක වැඩියෙන්ම ප්‍රදර්ශනය වුණේ ජාතික රූපවාහිනියේ ඇති වුණ කැරලිකාරී තත්වය තුළින්. එතැනදී ජනතා විමුක්ති පෙරමුණ ක්‍රියා කරන්නට වුනේ වමේ වෘත්තීය සමිති නායකයින් සමහ එකට අත්වැල් බැඳ ගනිමිනුයි. මේ අත්වැල් බැඳ ගැනීම තුළින් ආණ්ඩුවට මරු පහරක් එල්ල කරන්නටත්, අන්තිමේදී ආණ්ඩුව පල්ලම් බස්සන්නත් පුළුවන් වුණා. මේක නිර්ධන පංතිය පැත්තෙන් ගත්තහම ලොකු පියවරක්.
ආණ්ඩුවේ යුද්ධ ක්‍රියාදාමය ගැන තුට්ටුවකට මායිම් නොකර සටන ඉදිරියට ඇදුන එකත්, වෙනත් කම්කරු කොටස් මෙයට උදව්වට ඇදිල ආපු එකත් ආණ්ඩුවට ලොක පාඩමකුත් වුණා.

ඒත් ලොකුම බලපෑම ඇති වුණේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුලටයි. නොසිතූ විදියට දේශප්‍රේමය වෙනුවට සමාජ අරගල සටන්පාඨය එම පක්ෂය ඇතුළෙන් උඩට ආව.

ලාල් කාන්ත කිව්වත්, වික්‍රමබාහු කිව්වත් කම්කරුවන්ගේ සටන් ඇවිස්සීම තුළ ඇති වන ජවය ඔළුවල තිබෙන මත අනුව වෙනස් කරන්න බෑ. වැඩපල හා පොදුවේ සමජ රාමුව තුළ තිබෙන සූරා කෑමේ ධනපති ක්‍රියදාමයටම විරුද්ධ සටන ප්‍රකාශයට පත් කරනුයේ තරුණයන්ගේ ආයුධ සන්නද්ධ අරගලයටත් වඩා ධනපති ක්‍රමයටම වේදනා දෙන්නා වූ නිර්ධනයින්ගේ වැඩ වර්ජන සහිත පංති අරගලයයි.

මේකට කම්කරුවන් යොමු කළහම එය ලේසියෙන් නතර කරන්නට බෑ. එදා, 89 දී ආයුධ සන්නද්ධව හිටපු ජවිපෙටත් රුපියල් 2500 ඉල්ලීම් උඩ සටන විහිදී යන එක ලේසියෙන්ම වෙන පැත්තකට හරවන්නට බැරි වුණා. ඒ නිසා බොරු ජයක් පෙන්නල බස් වැඩවර්ජනයක් හැටියට පමණක් අවසන් කරන්නට ඔවුන්ට සිද්ධ වුණා. ඊට පස්සේ ආයිමත් ඉන්දීය හමුදා ගෙදර යැවීමේ සටනට යොමු වුණත් සිද්ධ වුනේ දහස් ගණන් මැරුම් කන පරාජයකට යොමු වෙන්නටයි.

මේ ගමනත් ලාල් කාන්තව දමල නිර්ධන සටන් ඇදල ඒවා තරුණ කැරලිකරුවන්ගේ වලිගයේ ගැට ගහන්න අමරසිංහ මහත්තයා හිතනව ඇති. හැබැයි අද බලයේ ඉන්නේ ඔවුන්ම බලයට ගෙනාපු, ඔවුන්ම වගකිව යුතු ජාතිවදී, යුධවාදී ආණ්ඩුවක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සම්ප්‍රදායික කොටස් ආණ්ඩුවෙන් ඉවත් වෙලා ගිහින් නෑ.

පහළ පීඩිතයන් අතර ජනතා විමුක්ති පෙරමුණට යම් හයියක් ඇති. එත් ගමේදී හැපෙන එක ලේසි නෑ. එදා ගම්වල දේශප්‍රේමී බලවේගය දියත් වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලවතුන් හරහායි. ඒ අය තමා තරුණයන්ට ආරක්ෂව හා සම්පත් ලබා දුන්නේ. මේ තත්වය වෙනස් වෙලා ගමේ ශ්‍රී ලංකාකාරයා සමහත් හැප්පෙමින් ජාතිවාදී රැඩිකල් බලයක් ගොඩනගන එක ලේසි නෑ.

හැබැයි සාමාන්‍ය සමාජ අරගලයේදි නම් ඒ අයත් ඇදිල ඒවි. එහෙම වුණොත් අද ගොඩනැගෙන්නේ වමට විරුද්ධ දේශප්‍රේමී බලයක් නම් නෙවෙයි. ඊට වඩා හාත්පසින්ම වෙනස් රැඩිකල් සමාජ විප්ලවකාරි බලවේගයක්. මේ නිසා ලාල් කාන්ත ඇතුළු ජවිපෙ වෘත්තීය සමිති නායකයින් ඇති කරන වෘත්තීය සටන්වලදි වමට තියෙන්නේ ජවිපෙ අවස්ථාවාදී ධනපති මුක්කු දේශපාලනය ගැන විවේචනය කරමින්ම සටනට හවුල් වීමයි.

ජාතික රූපවාහිනියේ සටන තුළ මේ එක්සත් පෙරමුණු ක්‍රියා කලාපය හොඳින් දියත් වුණා. දන් ලාල් කාන්ත විමල් ගැන කරන විවේචනයෙන්ම ඔවුන් මෙතෙක් කල් ගෙන ගිය මුළු දේශපලනයම විවේචනයට ලක් වෙනව.

විමල්ට ඇති වෙලා තිබෙන බලපෑම් ගැන ඔහුට පමණක් දොස් පවරන්නට බෑ. එය මෙතෙක් ගෙන ගිය දේශපාලනයේම කොටසක්. එයට වගකිව යුත්තේ මූලිකවම ටිල්වින්. මොකද? ඔතන දේශපාලනමය වශයෙන් හිතන ලොකුම මිනිහ ටිල්වින්. එයාගේ අවසරයක් නැතිව විමල් මොනම දෙයක්වත් කළා කියලා මට නම් පිළිගන්නට බෑ.

ජනතා විමුක්ති පෙරමුණ සමඟ 97 - 99 තුළ අප ගෙන ගිය එක්සත් පෙරමුණු වැඩපිළිවෙල තුළදි අපට ලැබුණ එක ජයග්‍රහනයක් තමා එම පක්ෂයේ නායකයන්ගේ වැඩ කටයුතු බලාගන්නට ලැබීම. ඒ අනුව තමා මං හිතන්නේ මේ බෙදීම්වලදී හා පරණ දේශපාලනයේදි ටිල්වින්ගේ ක්‍රියාකලාපය ඉතාම වැදගත් බව. කොහොම වුණත් මේ ආරවුල උඩ පංති සටනේ අළුත් ක්‍රියාමාර්ගයන් තීන්දු කරන්නට සිද්ධ වේවි.